# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை
## MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

# BIOFACH 2027

## ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය, නියුරම්බර්ග්, ජර්මනිය

## 16 -19 පෙබරවාරි 2027 - නියුරම්බර්ග්, ජර්මනිය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2027 පෙබරවාරි 16 සිට 19 දක්වා ජර්මනියේ නියුරම්බර්ග් හි පැවැත්වීමට නියමිත BIOFACH 2027 ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපයක් සංවිධානය කිරීමට කටයුතු සූදානම් කර ඇත. BIOFACH වෙළඳ ප්‍රදර්ශනය ලොව විශාලතම කාබනික වෙළඳ ප්‍රදර්ශනය ලෙස සැලකෙන අතර, එමගින් කාබනික ආහාරපාන නිෂ්පාදකයින්, අපනයනකරුවන් සහ ගැනුම්කරුවන්ට ව්‍යාපාර දැනුම සහ තාක්ෂණය පිළිබඳ විශේෂඥතාව හුවමාරු කර ගැනීම සඳහා එකම ස්ථානයකදී හමුවීමට අවස්ථාව සැලසේ. ප්‍රධාන වශයෙන් යුරෝපා සංගමයේ (EU Region) සහතික කළ කාබනික නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ ජාත්‍යන්තර වෙළඳපොළේ නව ප්‍රවණතා අධ්‍යයනය කිරීමට දේශීය සමාගම්වලට හැකියාව ලබා දීම ශ්‍රී ලංකා වෙළඳමණ්ඩපය සංවිධානය කිරීමේ අරමුණ වේ. තවද, SLS 1324 සහතික කළ ශ්‍රී ලාංකික කාබනික නිෂ්පාදන සහ ආරක්ෂිත භූගෝලීය දර්ශක (PGI) සහතික කළ ලංකා කාබනික කුරුඳු නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ ප්‍රදර්ශන කුටියක්ද මීට සමගාමීව සංවිධානය කෙරේ.

### අයදුම් කළ හැක්කේ කා හටද?

EU Organic ජාත්‍යන්තර ආහාර ප්‍රමිතීන් සහ SLS 1324 ශ්‍රී ලංකා කාබනික (Sri Lanka Organic) ප්‍රමිතීන්ට අනුකූල වන, ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රමාණවත් සැපයුම් ධාරිතාවක් ඇති, පහත සඳහන් නිෂ්පාදන කාණ්ඩ යටතේ සහතික කළ කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන සැකසුම්කරුවන්/අපනයනකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

- සැකසූ සහ නැවුම් පලතුරු සහ එළවළු (ශීත කළ, විජලනය කළ සහ කල් තබා ගත් පලතුරු සහ එළවළු, පළතුරු යුෂ, ටින් කළ සහ බෝතල් කළ නිෂ්පාදන)
- පොල් ආශ්‍රිත නිෂ්පාදන (වියළි පොල්, පොල් කිරි, ක්‍රීම් සහ පවුඩර්, පොල්/තැඹිලි වතුර, රස කළ පොල් කැබලි ආදිය)
- කුළුබඩු සහ කුළුබඩු මිශ්‍රණ, තැගි ඇසුරුම්වල කුළුබඩු, ආහාර අමුද්‍රව්‍ය, ක්ෂණික කුළුබඩු සකස් කිරීම සහ PGI සහතික කළ සිලෝන් කුරුඳු නිෂ්පාදන.
- තේ
- රසකැවිලි සහ බේකරි නිෂ්පාදන, විශේෂිත පහසු ආහාර නිෂ්පාදන, ධාන්‍ය සහ ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන, සෞඛ්‍ය සම්පන්න ආහාර, ආහාර අතිරේක
- පාන වර්ග (ඖෂධීය තේ, මධ්‍යසාර නොවන පාන වර්ග, ඖෂධීය පාන වර්ග)

### සහභාගීත්ව පිරිවැය

ඉඩකඩ වෙන්කරවා ගැනීම, කුටි ඉදිකිරීම සහ අනෙකුත් සියලුම වියදම් සහභාගී වන සමාගම් විසින් දැරිය යුතුය. ප්‍රතිපාදන මත පදනම්ව, තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (SME) සමාගම් සඳහා ඉඩ පහසුකම්/ඉදිකිරීම් සඳහා වන පිරිවැයෙන් කොටසක් සඳහා මූල්‍ය ආධාර සැපයීම පිළිබඳව අපනයන සංවර්ධන මණ්ඩලය සලකා බලනු ඇත.

### අයදුම් කරන ආකාරය සහ තෝරා ගැනීම

අයදුම්පත්, අපනයන සංවර්ධන මණ්ඩලයේ www.srilankabusiness.com වෙබ් අඩවියේ "Announcements" වෙතින් බාගත කළ හැකිය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 ජූලි 17 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ – අපනයන කෘෂි අංශය, අපනයන සංවර්ධන මණ්ඩලය වෙත එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "BIOFACH 2027" යනුවෙන් සඳහන් කළ යුතුය. වැඩසටහන සඳහා සුදුසු සහභාගිවන්නන් තෝරා ගැනීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා **ජයනි ගලගෙදර මහත්මිය** – සහකාර අධ්‍යක්ෂ, 011-2300732, 011-2300705-11– දිගුව :390., **jayani@edb.gov.lk** මගින් සම්බන්ධ කරගත හැක.

**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB / EDB කුලුන, අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**